Remove Watermark Now

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර.

## දෙවන වාර ඇගයීම - 2018

## පුරවැසි අධ්‍යාපනය I-II

## 11 ශ්‍රේණිය

**කාලය පැය 03**

**සැලකිය යුතුයි.**

**(i) I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය බැවින් එම ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

<u>I කොටස</u>

- ප්‍රශ්නවලට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. "ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය යටතට ගැනෙන බොහෝ කරුණු පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලකයින් විසින් ද අනුගමනය කර ඇති බව පැවසේ" එවැනි රාජ්‍ය පාලකයෙකු වනුයේ,
   1. දෙවන පැතිස්ස රජතුමා   2. දුටුගැමුණු රජතුමා
   3. පණ්ඩුකාභය රජතුමා   4. ධාතුසේන රජතුමා

2. ඍජුව හෝ වක්‍රව පාලන කටයුතු වෙනුවෙන් ජනතා සහභාගිත්වයට ඉඩ ප්‍රස්ථා සැලසී ඇති පාලන ක්‍රමය වනුයේ,
   1. රදල පාලන ක්‍රමය   2. සමාජවාදී පාලන ක්‍රමය
   3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය   4. ඒකාධිපති පාලන ක්‍රමය

3. "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි" යනුවෙන් නිර්වචනයක් ඉදිරිපත් කරන ලද්දේ,
   1. සීලර්   2. ඒබ්‍රහම් ලින්කන්   3. ජේ.ආර්. ලවෙල්   4. වින්සන්ට් චර්චිල්

4. "ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි." මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,
   1. ඇරිස්ටෝටල්   2. ඒබ්‍රහම් ලින්කන්   3. හැරල්ඩ් ජේ ලැස්කි   4. සීලර්

5. "නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල වුවද ඍජුවම ඡන්ද දායකයන්ගේ අදහස් විමසුමට ලක් කරන අවස්ථා ඇත." එයට උදාහරණයක් වනුයේ,
   1. ජනාධිපතිවරණය   2. ජනමත විචාරණය
   3. මහා මැතිවරණය   4. පළාත් පාලන මැතිවරණය

6. ද්වි පක්ෂ ක්‍රමයක් ඇති රාජ්‍යයකට නිදසුනක් වනුයේ,
   1. ඇමරිකා එක්සත් ජනපදය   2. රුසියාව
   3. චීනය   4. කියුබාව

7. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයෙකු වීමට අවශ්‍ය මූලික සුදුසුකමක් නම්,
   1. වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හා ශ්‍රී ලාංකිකයෙකු වීම.
   2. වයස අවුරුදු 30 සම්පූර්ණවීම හා ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
   3. වයස අවුරුදු 15 සම්පූර්ණ වීම හා ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
   4. වයස අවුරුදු 21 වීම හා උසාවියකින් වරදකරු වී සිරගත නොවී සිටීම.

8. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක දැක්වෙන සිතියමේ අංක 01,02,03 යනුවෙන් දැක්වෙන්නේ,
   1. කොළඹ, ගම්පහ, කළුතර   2. යාපනය, මහනුවර, ගාල්ල
   3. රත්නපුර, බදුල්ල, නුවරඑළිය   4. මාතර, හම්බන්තොට, මොණරාගල

papers.lk pdfelement

9. රාජ්‍ය සමන්විත වන ආයතන අනුපිළිවෙලින් නිවැරදිව දැක්වෙන්නේ පහත දැක්වෙන කුමන ප්‍රකාශයෙන්ද?
   1. භූමිය, ජනගහනය, විධායකය, ආණ්ඩුව
   2. භූමිය, ජනගහනය, අධිකරණය, ව්‍යවස්ථාදායකය
   3. භූමිය, ජනගහනය, විධායකය හා ස්වාධිපත්‍ය බලය
   4. භූමිය, ආණ්ඩුව. ජනගහනය හා ස්වාධිපත්‍ය බලය.

10. අණ්ඩුවේ ප්‍රධාන අංග නිවැරදිව අනුපිළිවෙලින් දැක්වූ විට ප්‍රකාශ වන්නේ,
   1. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යනුවෙනි.
   2. අධිකරණය, ව්‍යවස්ථාදායකය, අධිකරණය යනුවෙනි.
   3. විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය නමිනි.
   4. අධිකරණය, විධායකය හා ව්‍යවස්ථාදායකය නමිනි.

11. පාර්ලිමේන්තු අණ්ඩු ක්‍රමයකදී දේශපාලන විධායකය ලෙස ගැනෙන්නේ,
   1. රාජ්‍ය සේවයේ පරිපාලන නිලධාරින්ය.
   2. ජනාධිපති හා කැබිනට් මණ්ඩලයයි.
   3. අගමැතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයයි.
   4. මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රී මණ්ඩලයයි.

12. ව්‍යවස්ථාදායකයට අයත් බලතල හා කාර්යය යටතට ගැනෙන්නේ,
   1. මූලික අයිතිවාසිකම් සුරක්‍ෂා කිරීම.
   2. නීති විවරණය කිරීම.
   3. පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූල බව පිරික්සීම.
   4. පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම.

13. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව යුද්ධය හා සාමය ප්‍රකාශ කිරිමේ බලය හිමි පුද්ගලයා වන්නේ,
   1. ජනාධිපති 2. අගමැති 3. නීතිපති 4. අගවිනිසුරු

14. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශිය පාලන ඒකක වෙත පවරා දීම.
   1. බලය විමධ්‍යගත කිරීම වේ. 2. බලය මධ්‍යගත කිරීම වේ.
   3. බලය බෙදා හැරීම වේ. 5. බලය පවරා ගැනීම වේ.

15. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවන ලද්දේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි කිනම් ව්‍යවස්ථා සංශෝධනය අනුවද?
   1. 13 2. 17 3. 18 4. 19

16. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් සභා ගණන වනුයේ,
   1. 6 කි 2. 7 කි. 3. 8 කි. 4. 9 කි

17. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේදී යොදාගෙන ඇති පාලන ඒකක නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?
   1. පළාත් සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ප්‍රාදේශිය සභාව
   2. මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාව, පළාත් පාලන ආයතන
   3. ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, මධ්‍යම ආණ්ඩුව
   4. මහ නගර සභාව, නගර සභාව, මධ්‍යම ආණ්ඩුව

18. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සම්බන්ධව අදාළ වන කරුණු ගණනාවක් පහත දැක්වේ. ඉන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.
   A 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
   B 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය සංශෝධනය කිරීම.
   C ලැයිස්තු තුනක් යටතේ බලතල වර්ගීකරණය කිරීම.
   D පළාත් ආණ්ඩුකාරවරයා පළාත් සභා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම.
   1. BC හා D 2. AB හා C 3. B හා D 4. AC හා D

19. පොදු මං මාවත්, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා යනාදි කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ඉටු කිරීමේ කාර්ය පැවරී ඇති ආයතනය කුමක්ද?
   1. මධ්‍යම ආණ්ඩුව 2. පළාත් පාලන ආයතන
   3. පළාත් සභාව 4. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය.

Remove Watermark Now

20. ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ බලය හිමි අධිකරණය නම්,
    1. මහාධිකරණය
    2. අභියාචනාධිකරණය
    3. ශ්‍රේෂ්ඨාධිකරණය
    4. දිස්ත්‍රික් අධිකරණ

21. 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අනුව පිහිට වූ ආයතනය වනුයේ,
    1. රාජ්‍ය මන්ත්‍රණ සභාව
    2. ව්‍යවස්ථාදායක සභාව
    3. පාර්ලිමේන්තුව
    4. ජාතික රාජ්‍ය සභාව

22. 1972 දී ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට අනුව නාමමාත්‍රික විධායකය වූයේ,
    1. ජනාධිපති
    2. අගමැති
    3. කථානායක
    4. අග්‍රාණ්ඩුකාර

23. පහත සඳහන් ප්‍රකාශ අතුරින් මූලික අයිතිවාසිකම් යන සංගකල්පය වඩාත් පැහැදිලි කරනු ලබන ප්‍රකාශය තෝරන්න.
    1. එක්සත් ජාතීන් පිළිගෙන ඇති වෛකල්පිත සම්මුතිවල සඳහන් අයිතිවාසිකම්
    2. මානව හිමිකම් අතරින් තෝරාගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට ඇතුළත් කර ඇති අයිතිවාසිකම්ය.
    3. බොහෝ රටවල් මානව හිමිකම් ප්‍රකාශනයට අනුකූලව සකස් කර ගත් අයිතිවාසිකම්
    4. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් සියලු අයිතිවාසිකම්ය.

24. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?
    1. කෝල්බෲක්, සෝල්බරි, ඩොනමෝර්, මැනිං
    2. කෝල්බෲක්, ඩොනමෝර්, සෝල්බරි, මැනිං
    3. කෝල්බෲක්, මැනිං, සොල්බරි, ඩොනමෝර්
    4. කොල්බෲක්, මැනිං, ඩොනමෝර්, සොල්බරි

25. පළාත් පාලන ආයතන සතු බ ලතල හා කාර්යයන් වනුයේ,
    1. පනත් සම්මත කිරීම.
    2. නීති පැනවීම.
    3. මහජන සාමය හා ආරක්‍ෂාව
    4. මහජන උපයෝගිතා සේවා පවත්වා ගෙන යාම.

26. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුවට අයත් බලතල යටතට දැක්වෙන කරුණක් වන්නේ,
    1. නිවාස ඉදිකිරීම.
    2. සෞඛ්‍ය හා සනීපාරක්‍ෂණ සේවා
    3. පළාත් පාලන හා මහා මාර්ග
    4. විදේශ වෙළඳාම හා විදේශ කටයුතු

27. පළාත් සභාවට අයත් නොවන මධ්‍යම ආණ්ඩුවට පමණක් අයත් වූ බලතල දැක්වෙන ලැයිස්තුව වන්නේ,
    1. සමාගාමී ලැයිස්තුවට
    2. පළාත් සභා ලැයිස්තුව
    3. ප්‍රාදේශිය සභා ලැයිස්තුව
    4. සංවෘත ලැයිස්තුව

28. බහු සංස්කෘතික සමාජයක් බිහි වීමට බලනොපාන කරුණක් නම්,
    1. සමාජීය විවිධත්වය
    2. වාර්ගික විවිධත්වය
    3. නිදහස හා අයිතිවාසිකම්වලට ගරු කිරීම.
    4. එකම ජනවර්ගයක් පමණක් ජීවත් වීම.

29. යාපනය ප්‍රදේශයේ ජීවත් වන දෙමළ ජනතාව සම්බන්ධව බලපාන නීතිය නම්,
    1. තේසවලමෙයි නීතිය
    2. පහතරට නීතිය
    3. උඩරට නීතිය
    4. මුස්ලිම් නීතිය

30. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රධාන නීති නිලධාරිය වන්නේ,
    1. අග්‍රවිනිශ්චයකාරතුමා
    2. සොලිස්ටර් ජනරාල්
    3. නීතිපතිතුමා
    4. අධිකරණ අමාත්‍යතුමා

31. පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් සමාජයට එරෙහිව කරනු ලබන වැරදි සම්න්ධව බලපාන නීතිය වනුයේ,
    1. අපරාධ නීතිය
    2. සිවිල් නීතිය
    3. ජාත්‍යන්තර නීතිය
    4. සදාචාරාත්මක නීතිය

32. සිවිල් සුළු ආරවුල් විසඳීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ආයතනයකි.
   1. සමථ මණ්ඩලය
   2. කාකි උසාවි
   3. පළාත් බද අධිකරණය
   4. පවුල් උසාවි

33. මිනි මැරුම් සම්බන්ධ නඩු විභාග කිරීමේ බ ලය ඇති අධිකරණය වන්නේ,
   1. මහේස්ත්‍රාත් අධිකරණය
   2. දිසා අධිකරණය
   3. මහාධිකරණය
   4. පළාත් බද මහාධිකරණය

34. රටක උත්තරීතර මෙන්ම මූලික නීතිය ද වන්නේ,
   1. අපරාධ නීතිය
   2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය
   3. දේශීය නීතිය
   4. සිවිල් නීතිය

35. ගැටුම් නිරාකරණයේදී මැදිහත්කරුවෙකු සතුවිය යුතු ගුණාංගයක් විය යුත්තේ,
   1. ඉවසීම.
   2. කරුණාවන්ත බව
   3. අපක්‍ෂපාතිබව
   4. ඇහුම්කම් දීම.

36. පරිසර සංරක්‍ෂණය සම්බන්ධයෙන් වූ පුරවැසි යුතුකමක් වනුයේ,
   1. පරිසර නීති ක්‍රියාත්මක කිරීමට සහය දීම.
   2. පරිසර පිරිවැය තක්සේරු කිරීම.
   3. පරිසරය අලංකාරව පවත්වා ගැනීම.
   4. පරිසරයට සංවේදී වීම.

37. තිරසාර සංවර්ධනය සම්බන්ධව පුරවැසියා සතු ප්‍රධාන යුතුකමකි.
   1. පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදකයින් දිරි ගැන්වීම.
   2. අධිපරිභෝජනයෙන් වැළකීම.
   3. පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම.
   4. පාරිසරික බලපෑම් තක්සේරු කිරීම.

38. භෞතික පරිසරයට විශාල වශයෙන් හානි සිදුවූ ස්වාභාවික සංසිද්ධියකි.
   1. කාන්තාරීකරණය
   2. සුළි කුණාටු හා සුනාමි
   3. ගස් කැපීම හා නායයාම
   4. හිම දියවීම නිසා සාගර ජල මට්ටම ඉහළ යාමයි

39. වත්මන් ලොවේ පරිසර විනාශය බහුලවීමට තුඩු දි ඇති ප්‍රධාන කරුණක් වනුයේ,
   1. දිළිඳුකම
   2. නූගත්කම
   3. වැරදි ආකල්ප
   4. වාණිජවාදය

40. රටක ආර්ථික හා මානව සම්පත් අවභාවිතා කිරීම සංවර්ධනය අඩාල වීමට හේතුවකි. මෙය වළක්වා ගැනීමට වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයක් වනුයේ,
   1. රාජ්‍ය කළමණාකරණය නිසි අයුරින් සිදු කිරීම.
   2. ප්‍රජාතාන්ත්‍රවාදී පාලන ක්‍රමය ශක්තිමත් කිරීම.
   3. ඵලදායිතාව ඉහළ නැංවීම.
   4. යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

Remove Watermark Now

## II කොටස

Remove Watermark Now

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ස්වරූප 02 කුමක්ද?

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සමන්විත වන අංග ලක්ෂණ 02 ක් ලියන්න.

iii. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු 02 ක් සඳහන් කරන්න.

iv. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් ලියන්න.

v. ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවත්නා රටවල් 02 ක් ලියන්න.

vi. පළාත් පාලන ආයතනවලින් සපයන සේවා 02 ක් ලියන්න.

vii. මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක 02 ක් නම් කරන්න.

viii. ආණ්ඩුව සමන්විත අංග 02 ක් ලියන්න.

xi. අන්තර් ජාතික ගැටුම් බෙදා දැක්විය හැකි ආකර 02 කවරේද?

x. නීතියේ ගුණාංග 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 2x10= 20)

02. i. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යනු කුමක්ද? (ලකුණු 02)

ii. ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය සිදුවූ ආකාරය පිළිබඳව කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට බලපාන සාධක තුනක් නම් කර ඉන් එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. බහු සංස්කෘතික සමාජයක් යනු කුමක්ද? (ලකුණු 02)

ii. බහු සංස්කෘතික සමාජයක් නිර්මාණය වීමට හේතුවන කරුණු 03 ක් ලියන්න. (ලකුණු 04)

iii. බහු සංස්කෘතික සමාජයක වාසය කරන පුද්ගලයෙකු තුළ පැවතිය යුතු ගුණාංග 03 ක් නම් කර කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)

04. i. අර්ථ ක්‍රමයක් ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 02)

ii. ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුන දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න කවරේද? (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළඳ පොළ අර්ථ ක්‍රමයේ ලක්ෂණ 03 ක් සඳහන් කරන එක් කරුණක් කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

05. i. දේශීය නීතියේ ප්‍රභේද 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. මහාධිකරණයෙන් විසඳනු ලබන නඩු සඳහා නිදසුන් තුනක් ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

iii. ආරවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම 03 දක්වා එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

papers.lk
pdfelement

Remove Watermark Now

06. i. පළාත් බද මහාධිකරණය සතු අධිකරණ බලතල 03 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරීම සඳහා යොදා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත වී ඇති සමාජයක දැකිය හැකි ලක්‍ෂණ 03 ක් දක්වා එක් කරුණක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

07. i. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට හේතුවූ කරුණු 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. බලය විමධ්‍යගතකරණයේදී මුහුණ දීමට සිදුවන ගැටලු 03 ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

iii. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලින් මහජන සෞඛ්‍යයට අදාළව ඉටුකරන සේවා 03 ක් දක්වා එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

08. i. මානව අයිතිවාසිකම් දිනා ගැනීම හා සම්බන්ධව වැදගත් වන ඓතිහාසික සිදුවීම් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් පිළිගෙන ඇති මානව අයිතිවාසිකම් 03 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. ළමා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් නම් කර එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

09. i. ස්වාභාවික පරිසරයට අයත් අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පරිසරයෙන් අපට ලැබෙන සේවාවන් 03 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන ස්වාභාවික හේතූන් 03 ක් නම් කර ඉන් එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

Papers.lk
pdfelement